බීච් බෝයිස් කණ්ඩායම සුවිශේෂී අනන්‍යතාවයක් සහිත, මත්ද්‍රව්‍ය කෙරෙහි අධිඅවදානමක් සහිත කණ්ඩායමක් වන අතර සංචාරක කර්මාන්තය, මත්ද්‍රව්‍ය භාවිතය හා වාණිජ ලිංගික වෘත්තිය මෙම කණ්ඩායම අවදානම් සහගත වීමට හේතු වී තිබේ. එබැවින්, බීච් බෝයිස් කණ්ඩායමෙහි මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව අලුතින් පැනනගින අවදානම් චර්යාවන් මොනවාද යන්න මෙම අධ්‍යයනයෙහි අධ්‍යයන ගැටළුව වශයෙන් යොදාගනිමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක පර්යේෂණයක් වශයෙන් කොළඹ හා තදාසන්න වෙරළ තීරය, දකුණු වෙරළ තීරය යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. හිමබෝල නියැදීම යටතේ දත්තදායකයින් 10 දෙනෙකු අධ්‍යයනය සඳහා යොදා ගත් අතර සමාජ ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු ලබාගැනීම සඳහා කෙටි ප්‍රශ්නාවලිය ද, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සහ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ද දත්ත රැස්කිරීම සඳහා යොදාගන්නා ලදී. පර්යේෂණ සාහිත්‍ය තුළ මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ පර්යේෂණ ඉතාමත් අවම වන අතරම මෙම ක්ෂේත්‍රයේ කාර්යයේ නියුතු වූවන්ගේ අද්දැකීම් අනුව මෙම විශේෂිත කණ්ඩායම ආශ්‍රිතව මත්ද්‍රව්‍ය සම්බන්ධ නව අවදානම් චර්යාවන් හඳුනාගෙන ඇත. එබැවින් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව අලුතින් ඇතිවන අවදානම් චර්යාවන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වේ. අධ්‍යයන අනාවරණ අනුව සම්පූර්ණ නියැදියෙන් 74.4% ක් බහු මත්ද්‍රව්‍ය භාවිතාකරන්නන් වනඅතර වැඩි වශයෙන් භාවිතා වන මත්ද්‍රව්‍ය ලෙස හෙරොයින්, කොකේන්, ගංජා, එල්. එස්. ඩී හැඳින්විය හැකිය. මෑතකාලීනව භාවිතය ඉහලගිය මෙතැම්පිටමින් හා වෙරළසාදවල භාවිතා වන එක්ස්ටසි වැනි මත්ද්‍රව්‍යවල වැඩි භාවිතයක් ද හඳුනාගත හැකි වේ. වර්තමානය වනවිට බීච් බෝයිස් කණ්ඩායමේ රැකියා භූමිකාවේ සියලු අංග කෙරෙහි මත්ද්‍රව්‍ය සෘජුවම සම්බන්ධ වන අතර, මේ වනවිට මත්ද්‍රව්‍ය භාවිතය හා ඒ ආශ්‍රිත චර්යාවන් ඔවුන්ගේ රැකියාවේ අනන්‍යතාවයක් බවට පත්ව ඇත. මොවුන් මේ වනවිට වෙරළසාද හා වෙනත් සාදවල සංවිධායකයින් ලෙස කටයුතු කරන අතර, එම සාදවලට මත්ද්‍රව්‍ය සැපයීම, ලිංගික කටයුතු සඳහා කාන්තාවන් සැපයීම ආදිය සිදු කරයි. මේ අනුව බීච් බෝයිස් ලෙස කටයුතු කරන්නන් මත්ද්‍රව්‍ය සම්බන්ධව අධිඅවධානම් චර්යාවන්ට වඩාත් විවෘතවන අතර, මත්ද්‍රව්‍ය සැපයුම්කරුවන් හා ජාවාරම් ජාලය මෙහෙයවන්නන් බවට පත්වීම, බහුවිධ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූවන් බවට පත්වීම, මත්ද්‍රව්‍ය භාවිතා කර අනාරක්ෂිත ලිංගික කටයුතුවල යෙදීම, මත්ද්‍රව්‍ය භාවිත කරමින් සිදුකරන කණ්ඩායම් ලිංගික ක්‍රියාකාරකම් වලදී ලිංගික සේවා සැපයීම, මත්ද්‍රව්‍ය යොදා ගනිමින් ලිංගික කටයුතු කෙරෙහි පුද්ගලයින් පෙළඹවීම, අනාරක්ෂිත ලිංගික චර්යාවලට නිරාවරණය වුවද ඔවුන් HIV AIDS ඇතුලු ලිංගාශ්‍රිත රෝග පරීක්ෂාවන් වලට යොමු නොවීම, මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වලට යොමුවීමේ තත්වය ඉතාම අවම වීම පැහැදිලිව හඳුනාගත හැකි විය. මේ අනුව මෙම කණ්ඩායම මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හේතුවෙන් සෞඛ්‍ය අවධානම් සහගත බව මෙන්ම සාමාජීය වශයෙන් අනාරක්ෂිත තත්වයට පත්වන බවට නිගමනය කළ හැකි වේ.

***මුඛ්‍ය පද : මත්ද්‍රව්‍ය, බීච් බෝයිස් කණ්ඩායම, මත්ද්‍රව්‍ය භාවිතා කර ලිංගික චර්යා වල නිරත වීම (Chemsex), ලිංගාශ්‍රිත රෝග, HIV AIDS***

**ස්තුතිය : අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

## නව යොවුන් වියේ තරුණයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජයීය ලක්ෂණ

පී.එන්.අමරබන්දු[1],බී.සේනානායක[2],ඒ.ටී.දර්ශන[3], බී.වී.එච්.ඩබ්ලිව්.චතුරංගි [4], කේ.ඩී.ඒ.රණසිංහ [5]

[1]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[2]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[3]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[4]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[5]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

මත්ද්‍රව්‍ය ගැටලුව ශ්‍රී ලංකාව තුල මෙන්ම ගෝලීය මට්ටමින් ව්‍යාප්තවන පසුබිමක එය නව යොවුන් වියේ තරුණ ප්‍රජාව කෙරෙහි වර්තමානයේ සෘජු බලපෑමක් ඇති කරයි. තරුණයින් පිළිබඳ අධ්‍යයන රාශියක් සිදු කර තිබුණද නවයොවුන්වියේ තරුණයින්ගේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත මනෝසමාජ ලක්ෂණ පිළිබඳ අධ්‍යයන අවම මට්ටමින් සිදු කර ඇති නිසා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ හඳුනා ගැනීම, තරුණයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට බලපෑ හේතු සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ නව ප්‍රවණතා සහ රටා හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම සමීක්ෂණය සිදු කර ඇත. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය උපයෝගී කරගෙන අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා මගින් පුද්ගලයින් 64 දෙනෙකුගෙන් තොරතුරු ලබා ගන්නා ලදි. තරුණයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවීම සඳහා බලපාන හේතු සාධක ලෙස පවුල සමාජයීය පරිසරාත්මක සහ පුද්ගල මනෝ විද්‍යාත්මක සාධක බලපා ඇත. නියදියට අයත් පුද්ගලයින්ගෙන් මනෝවිද්‍යාත්මක සාධක යටතේ 60 දෙනෙකු කුතුහලය නිසා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇති බව හඳුනාගත හැකිය. 28 (39%) දෙනෙක් පවුලේ සාමාජිකයින් සමඟ ඌණ සම්බන්ධතා පවත්වාගෙන ගොස් ඇති බවත්, 18 (28%) දෙනෙක් පවුලේ සාමාජිකයින් සමඟ ආරවුල් ඇතිකර ගෙන තිබූ බව ද අනාවරණය විය. පාරිසරික සාධක යටතේ මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූ හේතු ලෙස , පුද්ගලයින් 49 (77%) ට කිසිඳු බාධාවකින් තොරව මත්ද්‍රව්‍ය භාවිත කළ හැකි ස්ථාන පැවතීමත්, පුද්ගලයින් 47 (73%) ට ජීවත් වන ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය සුලබව පැවතීමත් සඳහන් කර ඇත. සමාජයීය සාධක ලෙස මිතුරු කණ්ඩායම් වල බලපෑම 39 (61%) ක්, රැකියාව ආශ්‍රිත හේතුනිසා 15 (23%) දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුව තිබුණි. නැවත නැවත අත්අඩංගුවට පත්වීම, බන්ධනාගාර තුළ ලත් අත්දැකීම් සහ පෙර වැරදි හේතුවෙන් නීතිමය ගැටලු වලට මුහුණ පෑ පුද්ගලයින් ද නියදියට ඇතුළත් විය. තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි කුතුහලය, සෘණාත්මක හැඟීම, හුදෙකලා බව, මානසික ව්‍යාකූල බව, බලාපොරොත්තු බිඳ වැටීම යන මනෝ සමාජ ලක්ෂණ සෘජුව බලපෑමක් වී ඇති අතර සමාජයීය පවුල්මය හා පාරිසරික සාධක ද බලපෑමක් සිදු කළ බව නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද : නව යොවුන් විය, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, සුලබතාවය***

**ස්තූතිය : අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය**

**විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ චර්යා රටා**

පී.එන්.එස්.තිසේරා[1],පී.එන්.අමරබන්දු[2],බී.සේනානායක[3], ඒ.ටී.දර්ශන[4], බී.වී.එච්.ඩබ්.චතුරංගි[5]
[1]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[2]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[3]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[4]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
[5]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විද්‍යාර්ථීන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ චර්යා රටා පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට 2017 වර්ෂයේදී ඇතුළත් කර ගනු ලැබූ විද්‍යාර්ථීන් 88,527 දෙනා අතුරින් සසම්භාවී නියැදි ක්‍රමය ඔස්සේ තෝරා ගත් විද්‍යාර්ථීන් 1,431 දෙදෙනෙකුගෙන් යුතු නියැදිය අධ්‍යයනයට ලක් කරන ලදි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිත කිරීම මගින් ගුණාත්මක දත්ත රැස් කරන ලදි. මෙම අධ්‍යයන දත්තවලට අනුව නියැදිය තුළ නියෝජනය වූ විද්‍යාර්ථයින්ගෙන් 1275 (89%) දෙනෙකු සිසුන් වූ අතර 156 (11%) දෙනෙකු සිසුවියන් විය. ඔවුන්ගෙන් 350 (24.5%) දෙනෙක් අවුරුදු 22ට වැඩි අය වූහ. විද්‍යාර්ථයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අතීත තොරතුරු අධ්‍යයනය කිරීමේදී, 478 (33.4%) දෙනෙකු කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර තිබූ අතර ඉන් 443 (92.7%) දෙනෙකු නීත්‍යානුකූල මද්‍යසාර ද, 291 (60.9%) දෙනෙක් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ද, 120 (25.1%) දෙනෙක් ගංජා ද, 18 දෙනෙකු මනෝවර්තක ඖෂධ වර්ග ද භාවිත කර තිබුණි. නියැදියට ඇතුළත් වූ විද්‍යාර්ථීන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී, කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ විද්‍යාර්ථීන් 478 දෙනාගෙන් 303 (63.4%) දෙනෙකු වර්තමානයේදී ද කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවටත්, 175 දෙනෙකු මේ වන විට කිසිඳු මත්ද්‍රව්‍යයක් භාවිත නොකරන බවටත් ප්‍රකාශ කර තිබුණි. විද්‍යාර්ථීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව චර්යා රටා ලෙස මත්ද්‍රව්‍ය භාවිතය අධ්‍යයන කටයුතු සඳහා බාධාවක් නොවන බවට 123 (50.2%) දෙනෙකුත්, සමාජ ශාලා තුළ දී මත්ද්‍රව්‍ය භාවිත කළ බවට 25 (34%) දෙනෙකුත් ප්‍රකාශ කර තිබුණි. අධ්‍යයන නියැදියට අනුව විශ්වවිද්‍යාල සිසුන් අතර අන්තරායකර ඖෂධ වහෝ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ව්‍යාප්තියක් හඳුනා ගත හැකි අතර මෙය රටේ අනාගතයෙහි පැවැත්ම කෙරෙහි යම් බලපෑමක් එල්ල විය හැකි බව නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද : මත්ද්‍රව්‍ය දුර්භාවිතය, ඖෂධවලට ඇබ්බැහිවීම***

**ස්තුතිය : අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය**

*Session I [C] 11.00am to 12.30pm*

*Chaired by Dr. Jagath Bandara Pathirage*

## ***Changing Attitudes through the use of Media/ මාධ්‍ය භාවිතය තුළින් ආකල්ප වෙනස් කිරීම***

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ මිළදී ගැනීමේ හැසිරීම සම්බන්ධයෙන් ආකල්ප සකස් කිරීමේ ලා රූපවාහිනී වෙළෙඳ දැන්වීම් මගින් සිදුකරන බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්**

ආර්.ඩී.ඒ.එන්. තිලකසේන
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

මෙම අධ්‍යයනය මගින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවේ මිළදී ගැනීමේ හැසිරීම කෙරෙහි ආකල්ප සකස් කිරීමට රූපවාහිනී වෙළඳ දැන්වීම් කවරාකාර බලපෑමක් එල්ල කරන්නේ ද යන අධ්‍යයනය ගැටලුව පිළිබඳ පරීක්ෂා කර තිබේ. මේ සඳහා විශ්වවිද්‍යාලයේ සෑම වසරක්ම නියෝජනය වන ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 24 දෙනෙක් තෝරාගෙන ඇති අතර මෙය ආකල්ප පිළිබඳව කරනු ලැබූ අධ්‍යයනයක් නිසා ප්‍රත්‍යයික අධ්‍යයන සැළසුම ඔස්සේ ගුණාත්මක ක්‍රමවේදය යොදා ගෙන තිබේ. න්‍යායාත්මක පදනම ලෙස මෙහිදී විවේචනාත්මක න්‍යාය භාවිත කොට ඇත. මෙකී අධ්‍යයනයට අනුව සිසුන් තුළ වෙළඳපොලේ පවතින භාණ්ඩ හා සේවාවන් මිළදී ගැනීම සම්බන්ධයෙන් ධනාත්මක හා ඍණාත්මක ආකල්ප ඇති කිරීම සඳහා වෙළඳ දැන්වීම් භාවිත කර ඇති ආකර්ෂණ උපක්‍රම, පවතින සමාජ වාතාවරණයන්, සිසුන්ගේ සමාජ මට්ටම, සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ආදිය බලපා තිබේ. විශේෂයෙන්ම සිසුන් වෙළඳ දැන්වීම්වලට ඇදබැද තබා ගැනීම සඳහා වෙළඳ දැන්වීම් අනුගමනය කළ උපක්‍රම සිසුන්ට විශාල මනෝවිද්‍යාත්මක බලපෑමක් එල්ල කර තිබේ. එමෙන්ම පවතින සමාජ වාතාවරණයන් එනම් කොරෝනා වසංගත තත්ත්වය, වෙළඳ නිෂ්පාදනවල ප්‍රමිතිය පිළිබඳව පැවති අනාවරණය වීම්, මූල්‍යමය ගැටලු ආදිය ද සිසුන් විසින් වෙළඳ දැන්වීම්වල නිරූපිත භාණ්ඩ හා සේවා මිළදී ගැනීම් විචලනය කිරීමට බලපා තිබේ. එමෙන්ම සිසුන්ගේ සමාජ මට්ටම අනුව සමාජ පන්තිය තීරණය වූ අතර එය ද ඔවුන්ගේ මිළදී ගැනීමේ හැසිරීම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කර ඇත. එහෙත් සිසුන්ගේ අධ්‍යාපන මට්ටම මෙකී ආකල්ප ඇති කිරීමට එතරම් බලපෑමක් ඇති කර නොමැති බව පෙනී යන්නේ ඔවුන් භාණ්ඩ හා සේවාවන් මිළ දී ගැනීමේ දී ඒවායේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ඉතා අඩු අවධානයක් ලබා දීම නිසාවෙනි. ඒ අනුව මෙකී අධ්‍යයනයේ න්‍යායාත්මක පදනමට අනුව මෙකී වෙළඳ දැන්වීම් උපයෝගීතාවාදය මත පදනම් වූ මූල්‍යමය දෘෂ්ටියක් පමණක් අනුගමනය කොට ඇති අතර එබැවින් සිසුන්ගේ බුද්ධි මට්ටම අභිබවා ඔවුන් ප්‍රතිමානාත්මක චින්තන ක්‍රමයෙන් බැහැර කොට ඔවුන්ගේ ආකල්ප සඳහා විශාල බලපෑමක් එල්ල කිරීමට වෙළඳ දැන්වීම්වලට හැකි වී ඇති බව පැහැදිලි වේ.

***මුඛ්‍ය පද : මූල්‍යමය හැකියාව, අධ්‍යාපන මට්ටම, සමාජ වාතාවරණයන්,මනෝවිද්‍යාත්මක, ඇදබැද තබා ගැනීම***

# ශ්‍රී ලාංකික රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් නිරූපණය කරනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘතීන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ ආකල්ප වෙනස් කිරීම සඳහා එල්ල කරන බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්.එම්.ඩබ්ලිව්.ජී.එස්.ආර්. රාජපක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

මෙම අධ්‍යනයෙන් විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප වෙනස් කිරීම සඳහා රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් නිරූපණය කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘති බලපා ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙම අධ්‍යයනය ප්‍රත්‍යයක අධ්‍යයන සැලසුම යටතේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් සිදු කරන ලදී. මෙහිදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සියලුම වසර කණ්ඩායම්වලට අයත් සිසුන් 24 දෙනෙකු අරමුණු සහගත නියැදිය යටතේ තෝරාගත් අතර තේමාකරණය ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කෙරිණි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව බොහෝ විශ්වවිද්‍යාල සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය වීම සඳහා වෙළඳ දැන්වීම්වල නිරූපණය කරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඒකාකෘති ඉවහල් වී තිබේ. නමුත් ඇතැම් වෙළඳ දැන්වීම්වල භාෂාව විකෘති කොට සන්නිවේදනය කිරීම නිසා පණිවිඩය නිසි ලෙස ග්‍රහණය නොවීම මත සමහර සිසුන් භාෂාව පිළිබඳ ඒකාකෘති කෙරෙහි සෘණාත්මක ආකල්පයක් දැරූහ. නමුත් බහුතරයක් සිසුන් සාමූහික හැසිරීම් පිළිබඳ ඒකාකෘති කෙරෙහි ධනාත්මක ප්‍රතිචාරයක් දැක්වූ අතර පුද්ගලවාදී හැසිරීම් පිළිබඳ ඒකාකෘති කෙරෙහි සෘණාත්මක ප්‍රතිචාරයක් දැක්වූහ. එසේම ඇඳුම්-පැළඳුම් පිළිබඳ ඒකාකෘති අතුරින් බොහෝ සිසුන් සාම්ප්‍රදායිකත්වය සහ නවීනත්වය යන දෙකම මුසු වූ ඇඳුම්-පැළඳුම් අනුකරණය කිරීමට දැඩි ලෙස පෙළඹී ඇත. බොහොමයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන්ගේ ආකල්පය අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව විවිධ වෘත්තීන් වර්ගීකරණය කිරීම මගින් කාන්තාවගේ වෘත්තීමය නිදහස අහිමි වේ. නමුත් බොහෝ ශිෂ්‍යයන්ගේ ආකල්පය වූයේ ඇතැම් වෘත්තීමය අවස්ථාවන් සඳහා ප්‍රවේශ වීමට කාන්තාවන්ට විවිධ සීමාවන් පැනවිය යුතු බවයි. ශිෂ්‍යාවන්ට සාපේක්ෂව බොහෝ ශිෂ්‍යයන් විසින් පවුල් සංස්ථාවේ භූමිකාවන් සහ කාර්යභාරයන් පිළිබඳ ඒකාකෘති කෙරෙහි ඍජුව සහ වක්‍රව දැරූ ආකල්පය වූයේ ගෘහයේ කාර්යභාරයන් රැසක් කාන්තාව සතු පැහැර හැරිය නොහැකි අනිවාර්ය වගකීම් බවයි. ඒ අනුව ඉහත දැක්වූ සමස්ත කරුණු ඇසුරෙන් නිගමනය කළ හැක්කේ බලය පදනම් කොටගත් චර්යාව, සමාජ චිත්තවේගීය හැසිරීම් සහ ආකල්පමය වශයෙන් වෙනස්කම් සිදුවීමට රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් නිරූපණය කරන විවිධ ඒකාකෘති ප්‍රබල ලෙස බලපෑම් කර ඇති බවයි.

***මූඛ්‍ය පද: ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ඒකාකෘති, ආකල්ප වෙනස් කිරීම***

## Social and Cultural Impact and Portrayal of Caste in Tamil Speaking Hindu Society: An analysis based on the Tamil Film of Pariyerum Perumal

Nadarajah Pasdevan
Department of Sociology, University of Colombo, Sri Lanka

**Abstract**

Caste plays an important role in the lives of Hindus in India and Sri Lanka. Caste-based discrimination is not only a problem but a basic function of life in areas with a large Tamil Hindu community. In the history of Tamil cinema, some films talk about caste discrimination, but the current reality is not shown in the film. But the film selected for this review, *Pariyerum Perumal* (2018), perfectly describes how the arrogant actions of the upper caste affect the marginalized and downtrodden castes. The main objective of this study is to identify the real social and cultural implications of caste in the Hindu speaking society. The film's scenes, dialogues, and symbols are analysed as a case study. Through semiotic theory, analyses of the results are presented descriptively and photographically. According to the results obtained through the analyses, the director portrays the impact of caste through the character *Karuppi*. The colour of the dog is black. High society considers black to be the ugly and symbolic colour of Dalits, but in reality, it is the colour of the proletariat. The director has effectively conveyed the character of *Pariyan* by linking it to a black dog. “Red has more meaning and youth can make it more meaningful”- this quote by Che Guevara is displayed in red on the college wall. This verse shown in the film says that the voice of the youth should be for the revolution. Ultimately two glasses symbolize the need for a debate on why members of marginalized castes are served in a different glass? Glass teapots symbolize long-standing caste discrimination in Hindu Tamil society. It shows that caste is still a remnant. *Pariyerum Perumal* is a very powerful film that invites society to examine the misconceptions in the name of caste; it shows the extreme nature of social discrimination among Tamil-speaking Hindus.

***Keywords: Hindu Society, Pariyarum Perumal, Caste Discrimination***

*Session II [A] 1.30pm to 3.00pm*

*Chaired by Prof. Gameela Samarasinghe*

***Employment, Retirement and Uncertainty***

**Challenges of Household Self-Employed Women in Continuing their Self-Employment with Special Reference to Mawanella**

R. Moreen
Sri Lanka Teaching Service Schools

**Abstract**

Available sources show that women’s involvement in self-employment is increasing in Sri Lanka due to various reasons. According to the World Bank report self-employed females in Sri Lanka were reported at 44.45% in 2017. The current Covid 19 pandemic situation has impacted self-employed women. The objective of this study is to identify how the pandemic affects self-employed women. Self-employment is a way of survival; it is a strategy to balance their poverty. The study was conducted in Hingula GN division, Mawanella, Kegalle district using a questionnaire survey and interview methods. Fifty self-employed women consisted of the sample in the Hingula GN division. They were selected through the snowball sampling technique. This study found that 70% of the self-employed women’s monthly family income is below 10,000 and 60% of them are either widowed, divorced or separated. Such socio-economic conditions push them to become self-employed. The study findings reveal that self-employed women’s challenges have rapidly increased after Covid-19 pandemic. Sudden lockdown, difficulties in getting resources, high prices of goods, and lack of marketing opportunity, low profit, heavy loan and instalment payments are the main challenges faced by self-employed women. The study concludes that it is important for responsible authorities to create a favourable atmosphere to encourage women’s self-employment. Introducing loan schemes with lower interest rates, new policies and systems to continue their self-employment, and empowering them to overcome their issues are some important considerations.

***Keywords: Self-employed Women, Covid 19 pandemic, Lockdown, Grievance***

**Social and Economic Impacts of Tourism in Pinnawala Area**

P.K.U. Perera
Department of Tourism and Hospitality Management, Faculty of Management Studies,
Rajarata University of Sri Lanka, Mihintale

**Abstract**

Tourism is considered as one of the largest and fastest growing sectors all over the world. It contributes to the world Gross Domestic Production (GDP) in large amounts. The development of the tourism industry includes both infrastructure and superstructure facilities at a destination. Further, it also generates income and employment opportunities. Considering the community at a specific destination there are both positive impacts and negative impacts. Therefore, it is necessary to conduct a proper investigation to study the ground level impacts of tourism on a host community at a popular tourist destination. Pinnawala is such a popular tourist destination in Sri Lanka. The main attractions are Pinnawala Elephant Orphanage and the Open Zoo. Adopting both qualitative and quantitative research methods, this research gathered the required data by using questionnaires and personal interviews. The sample for the study consisted of 100 respondents selected using the convenient sampling method. There are many positive impacts in the destination such as generation of employment opportunities, enhancement of living status, development of superstructure and infrastructure. On the other hand, negative impacts such as increase in drug use, child labour issues, prostitution, diminishing host community culture practices are also prevalant. According to these facts it can be concluded that a proper tourism management plan needs to be designed and implemented at popular tourist destinations to counter the negative impacts and enhance the positive impacts.

***Keywords: Tourism, Pinnawala, Socio-Economic Impacts***

**Aging and Retirement: The Negative Experiences of Post-Retirement**

W.S.N. Siriwardhana
Department of Social Sciences, Rajarata University of Sri Lanka

**Abstract**

Aging is a natural biological process associated with human life. Over time, the person ages, and needs to adapt to that stage of life. Everyone has to accept the various opportunities and challenges they face in old age. The study focuses on understanding the relationship between the negative experiences of post-retirement life and post-retirement planning. Identifying the negative aspects of post-retirement experience and recognizing the importance of managing post-retirement life were the main objectives of this study. In order to collect primary data, 40 respondents were selected using a non-random, purposive sampling method. To ensure equal gender representation 20 males and 20 females were selected. Data collection was done using semi structured interviews. Findings illustrated that negative impacts are predominant in post-retirement life. For example, major negative effects of retirement transition included job loss, declining income and having to reorganize life activities, social isolation and changes to an individual's social acceptance. The main causes for these negative consequences are due to factors such as low income, low self-esteem and poor planning or lack of pre-planning. The post-retirement planning was much more advanced among women than men. The study emphasizes that the main reason for the difficulty in adapting to retirement life is not planning adequately for post-retirement life. In conclusion, it is revealed that there is a direct relationship between the negative conditions associated with post-retirement life and the lack of pre-retirement management.

***Keywords: Aging, Post-Retirement Life, Pre-Retirement Planning***

**New Paradigm Shifting of Sex Workers in Urban Slums of the Colombo District during the Covid-19 Pandemic**

H.A.S.U. Geethanjalee
Department of Political Science & Public Policy, Faculty of Arts, University of Colombo

**Abstract**

Since December 2019, the covid-19 pandemic has expanded from China to a number of countries. The main objective of the research is to identify the challenges to sex worker's economic, mental, social & healthcare wellbeing due to the new paradigm shifts between sex workers and clients under the pandemic. The main research problem is, how did the sex workers living in the urban slums in the Colombo district build their standard of living and manage their clients under the pandemic? The research sample was based on the 'Isuru Pedesa' & 'Havlock Town' urban slums where 30 sex workers (18-45) age category were interviewed through semi-structured interviews. The research findings explain that these sex workers often did their jobs in public space and that younger sex workers connected with sugar daddies. Travel restrictions, lockdowns disrupted their entire livelihoods, and many regular clients refused to even make contact. The vast majority (60%) of the urban slums' settlers were from rural areas and husbands of some sex workers lived from their wives' occupation. Lack of income leads to domestic violence. Therefore, younger sex workers opted to work for the same person for days. Consequently, they had to face social isolation, sexual violation, economic & health problems. Interruptions to the employment of middle-aged sex workers led many to turn to slavery as domestic violence escalated. In conclusion, sex workers are subjected to excessive mental and physical difficulties due to the pandemic. Furthermore, sex workers are made vulnerable due to the pandemic, many sex workers have resorted to other occupations and faced sexual harassments.

***Keywords: Covid-19, Sex Workers, Colombo Urban Slums***

*Session II [B] 1.30pm to 3.00pm*

*Chaired by Dr. M.T.M. Mahees*

## ***Uncertainty and Emerging Psycho-Social Issues/ අවිනිශ්චිතතාවය සහ නැගී එන මනෝ-සමාජ ගැටළු***

# වැඩිහිටියන් විශ්‍රාම යාමෙන් පසුව මුහුණ දෙන මනෝ සමාජීය ගැටලු සඳහා ප්‍රජා සමාජ වැඩ විෂය ක්ෂේත්‍රයේ වැදගත්කම අධ්‍යයනය කිරීම

එච්.කේ.ගොරකපිටිය[1], කේ.කේ.කේ.සී.රංගන[2],
[1]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - ශ්‍රී ලංකාව
[2]දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

**සාරසංක්ෂේපය**

වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පුද්ගලයෙකු වැඩිහිටියෙකු ලෙස සැලකේ. එය පිළිසිඳ ගත් දිනයේ සිට ආරම්භ වී මරණය දක්වාම සිදුවන ජීව විද්‍යාත්මක ක්‍රියාවලියකි. එය ගෝලීය සංසිද්ධියකි. විශ්‍රාම ගැනීම සාමාන්‍යයෙන් වැටුප් සහිත වැඩ කරන ජීවිතයෙන් ඉවත් වීම අදහස් කරයි. එය සාමාන්‍යයෙන් ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂය විසින් අර්ථ දක්වා ඇත්තේ "කායිාලයෙන් හෝ නිල තනතුරකින් ඉවත් වීමට; වැඩි විවේකයක් හෝ නිදහසක් භුක්ති විඳීම සඳහා තම ව්‍යාපාරය හෝ රැකියාව අත්හැරීම". මේ අනුව වැඩිහිටි පුද්ගලයන් විශ්‍රාම යාමෙන් පසු මුහුණ දෙනු ලබන මනෝ සමාජීය ගැටලු මොනවාද යන්න අධ්‍යයනය කිරීම කේන්ද්‍රකර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබුණි. මෙහි මූලික අරමුණ වනුයේ විශ්‍රාම යාමෙන් පසු වැඩිහිටියන් මුහුණ දෙන මනෝ සමාජීය ගැටලු හාප්‍රජා සමාජ වැඩ වැදගත් වන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත මෙම අධ්‍යයනය සිදු කරනු ලැබූ අතර අධ්‍යයන ක්ෂේත්‍රය වනුයේ කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මලගල ග්‍රාම නිලධාරී වසමයි. එහිඅරමුණු සහගත නියැදිය උපයෝගීකර ගනිමින් වයස අවුරුදු 60 – 80 වයස් මට්ටමේ විශ්‍රාමික වැඩිහිටියන් සිටින පවුල්12ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. ප්‍රත්‍යෙක අධ්‍යයන ක්‍රමය යටතේ දත්ත රැස්කිරීම සිදුකරන ලැබූ අතර තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය මඟින් විශ්ලේෂණය සිදුකරන ලදී. ක්ෂේත්‍ර දත්ත වලට අනුව විශ්‍රාමික වැඩිහිටියන් පාර්ශව දෙකක් සිටන බව හඳුනා ගැනීමට හැකියාව ලැබුණි. කායික, මානසික හා සමාජීය වශයෙන් දුර්වල තත්වයට පත් වීමෙන් පසු විශ්‍රාමගත් වැඩිහිටියන් හා විශ්‍රාම දිවිය තුළ වුවද කායික මානසික හා සමාජීය වශයෙන් ශක්තිමත් පුද්ගලයන් වේ. මෙම පාර්ශව දෙක සඳහාම ප්‍රජා සමාජ වැඩ වල මැදිහත් වීම මඟින් වැඩිහිටින් තුළ පවතින ශක්තීන් බල ගන්වමින් සමාජය වෙත තවදුරටත් ඵලදායී සේවාවක් ලබා ගැනීමට හැකියාව ලැබෙන බව මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. මෙම වැඩිහිටියන් සඳහා පවුල තුළ හා ඔවුන් ජීවත් වන ප්‍රජාව සුවපහසු පරිසරයක් ලෙස ගොඩනැංවීම තුළින් වැඩිහිටියන් මුහුණ දෙන හුදකලාභාවය වැනි මනෝ සමාජීය ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබෙන බව අනාවරණය කර ගැනීමට හැකිවිය. තවද මෙම ගැටලුව සඳහා නිවැරදි හා විධිමත් ප්‍රතිපත්තිමය ක්‍රමවේදයක් ඔස්සේ මැදිහත් වීමක් සිදු කිරීම තුළින් සමාජය තුළ පවතින ගැටලුව අවම කර ගැනීමට හැකියාව ලැබෙන බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද : විශ්‍රාමික, වැඩිහිටියන්, ප්‍රජා සමාජ වැඩ, මනෝ සමාජීය ගැටලු***

## Factors Affecting Professional Help Seeking Behaviour among Suicidal Elderly in Sri Lanka

S. Rasnayake[1], P. Navratil[2]
[1]Department of Sociology, University of Peradeniya, Sri Lanka
[2]Department of Social Policy and Social Work, Masaryk University, Czech Republic

### Abstract

Though the suicide rate is remarkably high among older persons in many countries, seeking external assistance in dealing with suicidality is infrequent. There is no doubt that help-seeking behaviour is critical in reducing suicide and suicide attempts, irrespective of age, gender, or any other psychosocial dynamics. The existing literature indicate that seeking external assistance for mental problems including suicidality is relatively higher among adolescents and youth than the elderly. Previous research, however, has not sufficiently discussed the reluctance for help-seeking of elderly who suffer from suicidal ideation. This paper attempts to respond to this research gap, based on a qualitative study carried out in Sri Lanka. Objectives of this paper is to examine the factors affecting low help-seeking behaviour of the elderly who committed suicide. This research is primarily a qualitative study based on the Phenomenological Approach. Thirty interviews with family members of older people who committed suicide between 2015 and 2020, identified through the researcher's social network in various parts of the country, were investigated. The study found four significant factors that limit the help-seeking behaviour of older people dealing with suicidality: a weak social network, poor understanding of depressive and suicidal signs by family members, negative attitudes relating to old age culture, and a crisis of personal perspectives in help-seeking. We conclude that promoting mental health services to older persons and improving their help-seeking behaviour in response to various life stressors would help prevent suicide among the older population.

***Keywords: elderly suicide, help-seeking, old age culture, social network, suicidal signs***

**ග්‍රාමීය සන්දර්භයේ ළමයින් පාසල් හැර යාම සඳහා බලපානු ලබන සාධක පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්**

කේ.එම්.අයි.එස්.කුමාර[1] , වී.පී.එස්.එස්.බාලසූරිය[2]

[1]සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

[2]සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

**සාරසංක්ෂේපය**

අධ්‍යාපනය දරුවෙකුගේ අනාගතය කෙරෙහි බෙහෙවින් ම පාදක වන්නා වූ සාධකයකි. එවන් පසුබිමක මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් පාසල් තුනක් ඇසුරෙන් සිසුන් පහලවක් තෝරාගෙන (N=15) අරමුණු සහගත නියදියක් යටතේ පර්යේෂණ සිදුකරන ලදී. පර්යේෂණ ගැටලුව වන්නේ ළමුන් පාසල් හැර යන්නේ කුමක් නිසා ද? අධ්‍යයනය කිරීම යි. ග්‍රාමීය සන්දර්භය තුළ දී ළමුන් පාසල් හැර යාම කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණු වේ. පාසල් හැර යාම හේතුවෙන් ළමුන්ගේ තත්වය සහ ඔවුන් පාසල් හැරයාම නිසා සමාජයෙන් දරුවන්ට එල්ලවන ප්‍රතිචාර සහ පාසල් හැර යාම වළක්වාලීම කෙරෙහි ගත හැකි විසඳුම් යෝජනා කිරීම සෙසු අරමුණුයි. අරමුණු ක්‍රියාවට නැංවීම තුළ දී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ගැඹුරු සම්මුඛ සාකච්ඡා ආදිය යොදා ගනු ලැබිණි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය යොදා ගනු ලැබිණි. මෙහි දී සොයාගත් පර්යේෂණ සොයාගැනීම් පහත පරිදි ය. මූලික වශයෙන් ම අනාවරණය වූ කරුණ වන්නේ දෙමාපිය නූගත් භාවය සහ සංදර්භයේ මිනිසුන් තුළ පවත්නා සීමාකාරී මානසිකත්වයන් ය. මව පියා දෙදෙනාගෙන් අයෙක් මිය යාම, නිතර දකින්නට අසන්නට ලැබෙන ආර්ථික දුෂ්කරතාවයන් උත්සන්න වීම, විශේෂයෙන්ම මව්වරු විදෙස් ගතවීම හේතුවෙන් ආදරය රැකවරණය අඩුවීමත් සමඟ ප්‍රේම සබඳතා මඟින් එය පූර්ණය කර ගැනීමට උත්සාහ දැරීම සහ අඩු වයසින් විවාහ වීම ද ප්‍රබල ව හඳුනාගත හැකි විය. දීර්ඝව විමසා බලන විට පාසල් හැර යාම හේතුවෙන් දරුවන් සමාජයෙන් ප්‍රතික්ෂේප වන ස්වභාවයක් ඉස්මතු වී පෙනිණි. මේ සඳහා ලබා දිය හැකි යෝජිත විසඳුම් කිහිපයක් දැක්විය හැකිය. පාසල් තුල දරුවන්ට උපදේශන සහ අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය පාසල් තුළ දරුවන්ට විවෘත ලෝකය පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කුතුහලය සහ වැනි මනෝභාවයන් දුරුකිරීම උදෙසා ලිංගික අධ්‍යාපනය වැනි අමතර ඉගැන්වීම් වැඩසටහන් ඔවුන්ට ලබාදීම ආදිය පෙන්වා දිය හැකිය. ග්‍රාමීය ප්‍රදේශයන්ගේ දරුවන් පාසල් හැර යාම සඳහා බලපාන සාධක පිළිබද සමාජ විද්‍යාත්මක විමර්ශනයක් සිදු කිරීම සාධනීය යැයි සටහන් කරමු.

***මුඛ්‍ය පද : අභිප්‍රේරණය, උපදේශනය, ග්‍රාමීය සන්දර්භයේ පාසල් ළමුන්***

*Session II [C] 1.30pm to 3.00pm*

*Chaired by Prof. Farzana Haniffa*

***Countering Uncertainty through Popular Protest/*** *පොදු විරෝධතා හරහා අවිනිශ්චිතතාවයට මුහුණ දීම*

**Populism, Protest and Mass Mobilisation: The Indian Narrative**

Angela Kishore
ICSSR Doctoral Candidate
Centre for South Asian Studies, School of International Studies, Jawaharlal Nehru University, India.

**Abstract**

Populism has become one of the political science discourses whose characteristics are still uncertain and contested. Despite everything, the undefined notion encompasses a broad range of unprecedented movements, protests, and demonstrations, whether political, social, or economic. Before diving into the conflict between democracy and populism, this paper engages with the knowledge already offered by numerous academics. This paper adds to the current research by focusing on the Indian context. As this article will expound on the concept of populist culture, a large segment of the public supports the dissatisfaction of the targeted group, making the issue more widespread in scope. In addition to addressing populist culture, this paper examines populist occurrences that had occurred in the previous decade. Albeit; populism is the central theme of this paper, which itself is in the construction process, as a discourse; it is still in debate. In Indian history, the recent decade will be known for large-scale demonstrations and a popular administration in authority. Populism, populist culture, and protest were all aimed at making this country more democratic. While there has always been some debate among political intellectuals regarding populism concreteness, what we find in the Indian context is a polished view of populism toward the targeted people. As a result of the political class's conversations, a gap has arisen, allowing populist actors to emerge to the fore. This article concludes by sketching the linkages between populism and democracy, as both are inextricably intertwined, from a strategic standpoint. Because populism frequently serves as a shadow image of democracy, the development of populist actors; is consequently because of the loop generated by political praxis.

***Keywords: Constitutional Expression, Democracy, Populism, Protest, Political efficacy***

**Fighting Contemporary Uncertainties: The International Involvement (NGO, INGO & Development Organizations) during the Post-War Peace Building Process in Sri Lanka**

A.M.R.S.K. Abesinghe
Graduate School of Social Sciences, Waseda University, Japan

**Abstract**

Living amidst uncertainties can be a herculean task for an individual or a community. Post - war peacebuilding in conflict affected states can be identified as one of such key uncertainties in the contemporary world & The Democratic Socialist Republic of Sri Lanka can be taken as a good example for such states. Thus, this study mainly focuses on the question; Do National, International and Development Organizations practically address the grass root level in the process of post-war peace building? Also, there is an in-depth analysis on how those organizations take part in the process of post-war peace building and the major challenges involved. In the research, the researcher mainly targets 10 organizations. The researcher could identify that the overall 57% of organizations approach the grass root level prioritizing youth (31%), Adults (15%) and women (11%). While analyzing the functioning of those selected organizations, it was revealed that the 'conflict transformation' is the highly-targeted focus area while democracy, human rights and governance, transitional justice, social cohesion & reconciliation act as the second vital area of study. Accordingly, the researcher was able to identify the lack of community participation, the negative influences of the Sri Lankan political party-based culture, the lengthy policies & legal framework in the Sri Lankan administrative structure and thereby stagnate the organizational contribution in the post- war peace building process in Sri Lanka. Most importantly, the researcher suggests the need for a novel peacebuilding model to remedy the negative consequences within the post war peace building in Sri Lanka.

***Keywords: National, International & Development Organizations, Post-War Peace Building***

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුල්ලිපොතාන ග්‍රාමසේවා වසමෙහි පශ්චාත් යුද්ධ සමය, ජනවාර්ගික ගැටුම් හා සිංහල - මුස්ලිම් අන්තර් ජනවාර්ගික සම්බන්ධතා**

ඩී.එම්.සී.ජේ. බණ්ඩාර

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

ප්‍රතිවිරෝධී අන්තර් සම්බන්ධතාවයන් ජනවාර්ගික වශයෙන් විෂමජාතීය සමාජයන්හි හඳුනාගත හැකි පොදු තත්ත්වයක් වුවත් පශ්චාත් යුද්ධ සමය තුළදී සිංහල - මුස්ලිම් ජනවාර්ගික ගැටුම මෙරට සමාජය තුළ වෙනස් මුහුණුවරකින් ඉදිරියට පැමිණි ආකාරයක් නිරීක්ෂණය විය. මෙම ගැටුම් හේතුවෙන් ගැටුම් ඇති වූ ප්‍රදේශවල ජීවිත හා දේපල හානි සිදුවීම මෙන් ම ජනවර්ග අතර වෛරය, සැකය හා අවිශ්වාසය වර්ධනය වීම සිදු වූ අතර මේ හේතුවෙන් සිංහල - මුස්ලිම් අන්තර් ජනවාර්ගික සම්බන්ධතාවයන්වල පවා බොහෝ වෙනස්කම් නිර්මාණය විය. ඒ අනුව මෙම තත්ත්වයන් ඓතිහාසික වශයෙන් සිංහල - මුස්ලිම් අන්තර් ජනවාර්ගික සම්බන්ධතා පැවති ග්‍රාමීය සමාජයන්හි අන්තර් ජනවාර්ගික සම්බන්ධතාවයන්ට කුමන බලපෑමක් සිදුකර ඇත්ද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනය මගින් සිදුකරන ලදී. අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගත් අතර අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුල්ලිපොතාන ග්‍රාමසේවා වසම තෝරා ගනු ලැබීය. අරමුණු සහගත නියැදීම යටතේ සිංහල සහ මුස්ලිම් පවුල් තිහක් හා ප්‍රධාන දත්ත දායකයන් තිදෙනෙකු ඇතුළත් වන පරිදි තිස් තුන්දෙනෙකුගෙන් සමන්විත නියැදියක් අධ්‍යයනය සඳහා තෝරා ගත් අතර නියැදියෙන් දත්ත ලබා ගැනීම සඳහා ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යොදා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය තේමාකරණය ඔස්සේ සිදුකර තිබේ. අධ්‍යයනයට අනුව ප්‍රදේශයේ සිංහල මුස්ලිම් ජනවර්ග අතර ඓතිහාසික වශයෙන් පැවැති සමාජ හා ආර්ථික සම්බන්ධතාවයන් ගැටුම්වලින් පසුව වෙනස්කම්වලට ලක් වී ඇති බව හඳුනාගනු ලැබීය. ඒ අනුව සිංහල - මුස්ලිම් ජනවාර්ගික ගැටුම් හේතුවෙන් එම ගැටුම් ඇති වූ ප්‍රදේශවල මෙන්ම එවැනි සිද්ධීන් වාර්තා නොවූ ඓතිහාසික වශයෙන් සිංහල - මුස්ලිම් අන්තර් ජනවාර්ගික සම්බන්ධතා පැවැති ග්‍රාමීය සමාජයන්වල පවා සිංහල - මුස්ලිම් අන්තර් ජනවාර්ගික සම්බන්ධතා වෙනස් වී ඇති බව අධ්‍යයනය මගින් හඳුනා ගන්නා ලදී.

***මුඛ්‍ය පද: පශ්චාත් යුද්ධ සමය, ජනවාර්ගිකත්වය, ජනවාර්ගික ගැටුම්, අන්තර් පුද්ගල සම්බන්ධතා, අන්තර් ජනවාර්ගික සම්බන්ධතා***

**Legislation to Protect Intangible Cultural Heritage in Libraries-A Promise to the Present and a Legacy for Future**

H.S. Samaradiwakara
Department of Law, University of Jaffna, Sri Lanka

**Abstract**

Cultural heritage is conceived as a part of the common heritage of mankind, and it includes both tangible cultural heritage (TCH) and intangible cultural heritage (ICH). The UN 2030 Agenda for Sustainable Development calls on governments to strengthen efforts to protect and safeguard the world's cultural heritage as well as to ensure public access to information and protect fundamental freedoms in accordance with national legislations and international agreements. As per the Convention for the Safeguarding of the Intangible Cultural Heritage, ICH is defined as practices, representations, expressions, knowledge, skills as well as the instruments, objects, artifacts, and cultural spaces associated therewith that communities, groups and in some cases, individuals recognize as part of their cultural heritage. Main 5 domains which manifests ICH are oral traditions and expressions, performing arts, social practices (rituals festivals), knowledge and practices concerning nature and the universe, and traditional craftsmanship. Convention provides definition of safeguarding ICH as to the measures aimed at ensuring the viability of the ICH including identification, documentation, research, preservation, protection, promotion, enhancement, transmission. ICH are constantly faced with the threat of destruction. To prevent dangers and threats and to avoid problems in the first hand the existence of legislation is truly a blessing to a nation enriched with cultural heritage. The paper utilized the qualitative methodology whereby the research surveyed the Convention for the Safeguarding of the Intangible Cultural Heritage and the Intellectual Property Act No 36 of 2003 as primary sources. As per the results, the paper highlighted the best practices such as urgent safeguarding list, in situ documentation of elements of ICH, national inventory, dissemination of information, sanctioning system adopted in Philippines towards the preservation of ICH and identified the Intellectual Property Act is not adequate to preserve and protect ICH. The research also relied upon secondary data which include existing literature, reports, scholarly articles. Research concluded by expressing the dire necessity to enact a separate Act adopting the best practices in the Philippines and in compliance with international standards.

***Keywords: Intangible Cultural Heritage (ICH), Laws, Preservation***

*Session II [D] 1.30pm to 3.00pm*

*Chaired by Snr. Prof. Premakumara de Silva*

## ***The State, Party Politics and Democracy within Uncertainty/***
## ***අවිනිශ්චිතභාවය තුළ රාජ්‍යය, පක්ෂ දේශපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය***

# දියාරු වන පක්ෂ දේශපාලනය හමුවේ අභියෝගයක් වන පුද්ගල දේශපාලනය

එච්.ඒ.එස්.යූ. ගීතාංජලී
දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

ජනතාවගේ දේශපාලන මතවාද හැඩගැස්වීමෙහිලා මෙන්ම ඔවුන් දේශපාලනික වශයෙන් සවිබල ගැන්වීමට අවශ්‍ය පසුබිම සැකසෙන්නේ දේශපාලන පක්ෂ හරහාය. ශ්‍රී ලංකාවේ පක්ෂ දේශපාලනය හා පුද්ගල දේශපාලනය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන අතර වත්මන් දේශපාලන අර්බුදය නව දේශපාලනික වෙනස්වීම් ගණනාවකට බලපෑම් කරයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, ග්‍රාමීය ජනතාව, පුද්ගල දේශපාලනය හා පක්ෂ දේශපාලනය සමඟ පවත්නා සබඳතාවය අධ්‍යයනය කිරීමයි. එමෙන්ම පක්ෂ දේශපාලනය අභියෝගයට ලක්වන අවධියක පුද්ගල දේශපාලනය වර්ධනය හා ව්‍යාප්ත වීම පිළිබඳව ද අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරයි. ඒ අනුව ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ, වර්තමාන දේශපාලන අර්බුදය ඔස්සේ සාම්ප්‍රදායික පක්ෂ දේශපාලනය සමාජය තුළ විවේචනය හා අභියෝගයට ලක්වන පසුබිමක තවදුරටත්, ග්‍රාමීය ජනතාව පුද්ගල දේශපාලනය සමඟ අන්තර්ග්‍රහණය වන්නේ මන්ද? යන්නයි. මොණරාගල දිස්ත්‍රික්කයේ ඔක්කම්පිටිය හා බුත්තල යන පර්යේෂණ ක්ෂේත්‍ර තුළ තරුණ, වැඩි◊හිටි, දේශපාලඥයන් මෙන්ම විද්වතුන්ගෙන් පර්යේෂණ නියැදිය සමන්විත වූ අතර ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන යන පර්යේෂණ විධික්‍රම භාවිතයට ගැනුණි. ප්‍රභූ දේශපාලන න්‍යාය, අනුග්‍රාහක-සේවාදායක සබඳතා න්‍යාය හා අවශ්‍යතා න්‍යාය දත්ත විශ්ලේෂණයට අවශ්‍ය න්‍යායාත්මක පසුබිම සැපයීය. ඒ අනුව, පවතින දේශපාලන වාතාවරණය හා අර්බුද හමුවේ ජනතාව පක්ෂ දේශපාලනයෙන් වියුක්ත වීමේ ප්‍රවණතාවයක් දැක ගත හැකි වුවද, තවදුරටත් ජනතාව පුද්ගල දේශපාලනය වටා තදින් අන්තර්ග්‍රහණය වී ඇති බව අනාවරණය විය. එයට ප්‍රධාන හේතුව වන්නේ දේශපාලඥයා හා ජනතාව අතර නඩත්තුවන අනුග්‍රාහක-සේවාදායක සබඳතාවයයි. ග්‍රාමීය ජනතාව තමන්ට ඉටු වූ සේවාව, හෝ හිතවත්කම මත දේශපාලඥයාට වැඩි පක්ෂපාතීත්වයක් හා ලැදියාවක් දක්වයි. විශේෂයෙන්, අනුග්‍රාහක-සේවාදායක සබඳතාවය ඔස්සේ ග්‍රාමීය ජනතා කුලකයේ තරුණ ප්‍රජාව පවා තමන්ට හිමි වූ වරප්‍රසාද හේතුවෙන් පුද්ගල දේශපාලනයට අභියෝග කිරීමේ වපසරිය සීමා සහිත බව තහවුරු විය. ඒ අනුව ග්‍රාමීය ජනතාව තමන්ගේ අවශ්‍යතා සන්තෘප්ත කර ගැනීම පුද්ගල දේශපාලනය සමඟ සම්බන්ධ කර ඇති බවත්, දේශපාලඥයා ජනතාවට සේවය සැපයීම මැතිවරණ ව්‍යාපාරයේ හා බල දේශපාලනයේ මෙවලමක් කොට ගෙන ඇති බවත් පැහැදිලිය. එනම්, පුද්ගල දේශපාලනය විසින් තමන්ගේ මතවාද හා දේශපාලන පැවැත්ම වෙනුවෙන් ජනතාව දේශපාලන මෙවලමක් වශයෙන් යොදා ගැනේ. දේශපාලඥයා හා ග්‍රාමීය ජනතාව අතර නඩත්තු වන්නේ දේශපාලනික සබඳතාවය අභිබවා ගිය ගණුදෙනුවක් බවත්, ඒ නිසාවෙන්ම පුද්ගල දේශපාලනයෙන් වියුක්ත වීමට අවකාශයක් නොමැති බවත් අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද: අනුග්‍රාහක-සේවාදායක සබඳතාවය, ග්‍රාමීය ජනයා, පක්ෂ දේශපාලනය, පුද්ගල දේශපාලනය, බල දේශපාලනය.***

**The Spirit of Democracy in National Employment Guarantee Scheme: An Evaluation of the E-Governance Initiative of India**

I.A.C. Manosh Aravind
Assistant Professor, Department of Sociology, VET Institute of Arts and Science College, Tamil Nadu, India

**Abstract**

The concept of Democracy has been strongly associated with 'welfarism' and the emergence of the welfare state. The theorisation of the 'welfare state' and the western notion of 'social protection' varies from the Indian welfare systems and policies. Out of many schemes that the Indian state has designed towards elevating the poorer conditions of its citizens, one scheme better known as Mahatma Gandhi National Rural Employment Guarantee Act, 2005 has guaranteed right to work provision to avail employment for a maximum period of one hundred days/year. In this context, this research aims to evaluate the effectiveness of the new E-governance reform, i.e. the DBT Mission introduced to the NREGA Scheme in 2013. The E-Governance reform comes as part of a series of measures in development to make it 'citizen-centric', which is accessible to the beneficiaries. The World Development Report-2016, published by the World Bank, discusses the potential benefits of E-Governance, such as greater transparency, greater accountability, and decentralisation. This research paper explores the linkages between democracy and E-governance systems. The paper explores democracy from three aspects, namely accessibility to the people, accountability of the state to its people, and transparency of the state in its functioning. Here the research question investigated is: How does the NREGA Scheme incorporate the elements of accountability, transparency, and accessibility (in terms of inclusion and exclusion) with the initiation of the DBT Mission? It is hoped that the study will bring the unexplored sociological dimension in E-governance systems that form an intermediary between the state and its people and the changing nature of people's participation in governance.

***Keywords: Participatory Democracy, Accountability, Transparency, Inclusion and Exclusion, E-Governance systems***

# රාජ්‍ය සහ පුරවැසියා අතර අන්තර්ක්‍රියාකාරීත්වය කෙරෙහි ග්‍රාමීය පරිපාලනයේ බලපෑම පිළිබඳ ඇගයීමක්

එච්.ටී.කේ. ඉෂාරා ජයරත්න
භාහිර කථිකාචාර්ය, දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව,
සහකාර පර්යේෂිකා,සෝෂල් ඉන්ඩිකේටර්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොළඹ, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

පුරවැසියා යනුවෙන් අප සාමාන්‍යයෙන් අදහස් කරන්නේ රාජ්‍යයක සාමාජිකයෙකු යන්නයි. එකී පුරවැසියා සහ රාජ්‍ය අතර අන්තර්ක්‍රියාරීත්වය කෙරෙහි පරිපාලනික ව්‍යුහය බහුවිධ මට්ටම් තුළින් ස්ථාපිත කර ඇත. ඒ අනුව ලංකාවේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සිවිල් පරිපාලනයේ මධ්‍යස්ථානය වන අතර දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය සහ ග්‍රාමීය පරිපාලනය සමඟ කටයුතු කරයි. ඒ අතරින් පුරවැසියා සහ රාජ්‍ය අතර ක්ෂුද්‍ර මට්ටමේ පරිපාලන ව්‍යුහය වන ග්‍රාම පරිපාලන ව්‍යුහය තුළ ග්‍රාමීය ප්‍රජාවට සමාන සංවර්ධනයක් සහතික කිරීම සඳහා පුළුල් කරන ලද පරිපාලන ව්‍යුහය (විශාල නිලධාරීන් සංඛ්‍යාව සහ කමිටු සංඛ්‍යාව) රාජ්‍ය සහ පුරවැසියා අතර අන්තර් ක්‍රියාකාරීත්වය ස්ථාපිත කිරීමට බලපා ඇත්තේ කෙසේද යන ආයතනිකවාදී පර්යේෂණ ගැටලුව තුළින් දේශපාලනික වශයෙන් පරිපාලන ව්‍යුහයේ පවතින රාජ්‍ය පුරවැසි භූමිකාවහි ස්වරූපය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. පුරවැසිභාවය පිළිබඳ න්‍යාය මත පර්යේෂණය න්‍යායිකව ස්ථානගත වන අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතා විය. පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රධාන කරුණක් වන්නේ රාජ්‍ය ප්‍රතිසංස්කරණ මගින් සිදු කරන පරිපාලනමය වෙනස්කම් සාර්ව තලයේ සිට ක්ෂුද්‍ර තලය දක්වා ක්‍රියාකාරීත්වය තුළ පවතින ප්‍රායෝගික දුර්වලතා මත රාජ්‍ය සහ පුරවැසි අන්තර්ක්‍රියාකාරීත්වය ප්‍රතිව්‍යුහගත වීම බවයි. තවද ප්‍රධාන පරිපාලන කතෘකයින්ගේ භූමිකාවන් තුළ පමණක් ස්ථාපිත පුරවැසි අන්තර්ක්‍රියාකාරීත්වයක් පවතින බවයි. එමෙන්ම බහුවිධ නිලධාරී ව්‍යුහය (සියලුම ග්‍රාම පරිපාලන ව්‍යුහයන් තුළම ප්‍රධාන කතෘකයින්ට අමතරව සංඛ්‍යාත්මකව 38දෙනෙකුගේ නිලධාරී ව්‍යුහයක් ඇත) පිළිබඳ නාමමාත්‍රික අවබෝධය ලිඛිත වාර්තාවන් තුළ පැවැතිය ද ප්‍රායෝගික සමාජ අවකාශය තුළ පවතින අසමාන ස්වභාවයහි වර්ධනය ඉහළ මට්ටක පැවැතීමයි. එමෙන්ම ප්‍රජා සහභාගීත්වය ප්‍රජා-මූල සංවිධාන සහභාගීත්වය තුළ රාමුගත වුවද නෛතිකව ස්ථාපිත ග්‍රාමීය බහුවිධ කමිටු තුළ ස්ථාපිත නොවීමේ පරිපාලනමය දුර්වලතාවක් පැවැතීම යන ප්‍රධාන කරුණු හේතු වී තිබේ. රාජ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ කතිකාව තුළ පුරවැසියා සහ රාජ්‍ය අතර අන්තර්ක්‍රියාකාරීත්වය නෛතිකව ස්ථානගත වීමට සාපේක්ෂව ප්‍රායෝගික සන්දර්භය තුළ ස්ථානගත නොවීම ග්‍රාමීය පරිපාලන ව්‍යුහය අකර්මන්‍ය ස්ථානගතවීමක් දක්වා පැවැතීමට හේතු වී තිබේ.

***මුඛ්‍ය පද : රාජ්‍ය භූමිකාව, පුරවැසියා සහ පුරවැසිභාවය, පරිපාලන ව්‍යුහය, ග්‍රාමීය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිසංස්කරණ***

**කොවිඩ්-19 අර්බුධය හමුවේ ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාවට සුබසාධක සේවා සැපයීමේදී ශ්‍රී ලංකාව මුහුණ පාන අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක කියවීමක්**

කේ.කේ.එච්. පවිත්‍රා
සහය කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

සුභසාධක රාජ්‍ය සංකල්පය නව ලිබරල්වාදී න්‍යාය රාමුව පදනම් වෙමින් මානව අභිවෘද්ධිය පාදක කොට ගෙන ගොඩනැගී ඇති නමුත් ප්‍රායෝගික ක්ෂේත්‍රය තුළ ගැටලු ගණනාවකටම භාජන වන්නකි. 2019 වසරේ සිට සමස්ත ලෝකයම මුහුණපාන කොවිඩ්-19 වසංගතය හරහා සිදුවන සෘණාත්මක ආර්ථික බලපෑම් වැඩි වශයෙන් සුභසාධක රාජ්‍යයන් කේන්ද්‍ර කරගනිමින් සිදුවන ආකාරයක් හඳුනාගත හැකිය. මෙහිදී සුභසාධක රාජ්‍යයන් අතර ඉහළම සුභසාධක සේවාවන් සපයන රාජ්‍යයක් වශයෙන් පෙන්වාදිය හැකි ශ්‍රී ලංකාව වර්තමාන කොවිඩ්-19 අභියෝගය හමුවේ බලපෑම් රාශියකට ලක්ව තිබේ. කොවිඩ්-19 ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ සුභසාධක සේවාවන් සැපයීම කෙරෙහි කුමනාකාර බලපෑමක් සිදු කර තිබේද යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. එහිදී ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රජය මගින් සපයන සුභසාධක සේවාවන් ප්‍රමාණවත් වන්නේද? යන පර්යේෂණ ගැටලුව මූලික කරගනිමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදි. පර්යේෂණ අරමුණ සාධනය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක්තරා ග්‍රාමසේවා වසමක් පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගත් අතර, එම ග්‍රාමසේවා වසමේ පදිංචි පවුල් අතරින් අරමුණු සහගත නියදිකරණය යටතේ අඩු ආදායම්ලාභී පවුල් 10ක් තෝරාගන්නා ලදි. එහිදී මාසික ආදායම රුපියල් හයදහසට වඩා අඩු වීම යන සාධකය මත පදනම්ව සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා ආධාර ලබන පවුල් 10ක් ග්‍රාම නිලධාරී මහතාගේ මගපෙන්වීම යටතේ තෝරාගන්නා ලදි. ප්‍රතිචාරිකයින් සමඟ සිදුකළ ගැඹුරු සම්මුඛ සාකච්ඡා හරහා රැස් කරගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කළ අතරල එහිදී රජය මඟින් සපයන සුභසාධක සේවාවන් ප්‍රමාණවත් නොවන බවටත්, තව තවත් ආධාර ලබාදිය යුතු බවටත් වන මතවාදයක් ජනතාව තුළ පවතින බව හඳුනාගත හැකිවිය. නමුත් ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත රාජ්‍ය අංශය හරහා හිමිවන සාමාන්‍ය ආධාර වලට අමතරව කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා තවත් අමතර ආධාර සහ සේවාවන් රාශියක් හිමිවන බව ක්ෂේත්‍ර දත්ත ඇසුරින් පැහැදිලි විය. නමුත් මෙම වසංගත ව්‍යාප්තිය හමුවේ ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාව තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමේදී පෙරටත් වඩා රාජ්‍ය සුබසාධනය මත යැපීමට උත්සාහ ගන්නා ආකාරයත්ල ඒ නිසා විවිධ ගැටලුකාරී තත්ත්වයන් ඉස්මතුවී ඇති ආකාරයත් හඳුනාගත හැකිවිය. කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාව තම ආදායම් මට්ටම මත හඳුනාගන්නා දරිද්‍රතා ආකල්පයන් අභ්‍යන්තරීකරණය කර ගැනීම හරහා සුබසාධක සේවාවන් වෙනුවෙන් ඔවුන්ගේ යැපුම් මානසිකත්වය තවදුරටත් වර්ධනය වී තිබෙන බව පැහැදිළිවම හඳුනාගත හැකිවිය. මේ ආකාරයට යැපුම් මානසිකත්වය අභ්‍යන්තරීකරණය වීම හරහා නිරපේක්ෂ දරිද්‍රතා මට්ටම ඉක්මවා ගිය සාපේක්ෂ දරිද්‍රතාවයෙන් පීඩා විඳින අඩු ආදයම්ලාභී ග්‍රාමීය ප්‍රජාවක් කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ නිර්මාණය වී තිබෙන බව මේ අනුව නිගමනය කළ හැකිය.

***මුඛ්‍ය පද : සුබසාධක රාජ්‍ය, ග්‍රාමීය අඩු ආදායම්ලාභී ප්‍රජාව, යැපුම් මානසිකත්වය, දරිද්‍රතාවය***

*Session III [A] 3.00pm to 4.30pm*

*Chaired by Dr. Tharindi Udalagama*

## ***Agrarian Responses to Uncertainty***

**Gender-Inequality in Agrarian Sector During the Covid-19 Pandemic**

H.A.S.U. Geethanjalee
Department of Political Science & Public Policy, University of Colombo, Sri Lanka.

**Abstract**

The covid-19 pandemic presents a devastating threat to lives and livelihoods around the world & it's not only a health crisis but also an economic, social and specially gender-inequality crisis. Some gender specific impacts are increased care burden for women and girls, and gender-based violence. The objectives of the research were to identify the key issues faced by the agrarian women during the pandemic in comparison to men. The aim of this research was to investigate the differences of gender stereotypes in the family and in agriculture and provide recommendations for accelerating the advancement of gender-equality in the agricultural sector. The research problem is, why did agrarian state women become more vulnerable than men during the pandemic period? Research sample was selected from age 15-50 category girls and women from the 'Parawila Watta' - a predominant Tamil estate cultivating rubber & sugarcane. Both qualitative and quantitative methods were utilized to collect data. The research findings explained that violence against agrarian women has increased as covid-19 heightened known problematic issues of financial problems, psychological problems, unnecessary pregnancies in the family and labor exploitation, salary issues, sexual violence, job-insecurity in the agrarian sector. The woman was the employee on the plantation, as well as the income earner in the family. While married women worked in the agricultural sector, men worked in public spaces outside the estate, and many men lost their jobs due to the pandemic. But they didn't join plantations and forcibly took the women's daily wage. However, her daily salary of 740 rupees was also reduced under the pandemic. Finally, it's clear that agricultural women face a number of issues as an employee as well as in the family. She is unable to escape the effects of patriarchy even in times of pandemic.

***Keywords: Agrarian Women, Covid-19, Patriarchy, Vulnerability***

# The Impact of Nutmeg Cultivation on the Village Economy

S.E.M.N.Y.K Senarath.[1], S.E.M.M.P.K Senarath.[2]
[1] Faculty of Agriculture, Rajarata University of Sri Lanka.
[2]Department of Economics University of Kelaniya.

**Abstract**

Nutmeg is a minor export crop which is cultivated only in a limited area in the up country of Sri Lanka. The attempt of this research was to identify how this cultivation impacts on the economy of rural people and the barriers they must face. The study also attempted to find solutions to overcome those barriers. The research was conducted among 300 families in Kandy district. Hundred and fifty families who directly depend on nutmeg cultivation were selected. The remaining 150 families cultivated nutmeg as a side income while being employed elsewhere. Information was collected from these families through a questionnaire. The collected data were analysed using SPSS software. From the analysis it was found that most of the nutmeg cultivators get higher prices for their crops by selling the kernel removing the outer cover. Some others sell them by drying nutmeg in the sun. With the income from nutmeg cultivation, some people have achieved good prospects. But they rarely get necessary advice from relevant agricultural officers to promote their cultivation and income. Some people who have regular income do not directly sell their harvest but stock them. Those who grow nutmeg as a livelihood are compelled to sell their crop soon after the harvest to the available market. It is hard to do any under cultivation because nutmeg trees are large trees with branches. The farmers should be provided with necessary advice to uplift their income, maintain healthy trees, to enrich the soil, and to protect nuts from fungus to get a higher income.

***Keywords: Nutmeg Cultivation, Village Economy, Rural Society***

**The Effects of the Fertilizer Crisis on Food Security in Sri Lanka**

L. Wijesuriya[1], O. E. Muoneke[2] and R. Nanayakkara[3]

[1]Department of History, University of Colombo, Sri Lanka.

[2]Faculty of Agriculture, University of Peradeniya, Sri Lanka.

[3]Department of International Relations, University of Colombo, Sri Lanka.

**Abstract**

Being one of the major agricultural states in South Asia, Sri Lanka has played and continues to play a prominent role in maintaining the food networks of this region. This research will answer the crucial questions of; 1) How has the fertilizer crisis affected rice production and consumption? 2) How has the South Asian region dealt with similar problems of food insecurity? 3) What are the ways in which the problems faced by small-scale producers and consumers can be negated? As a country linked to others by rice imports/exports, Sri Lankan food insecurity cannot be comprehended in isolation. The research will thus place the current Sri Lankan crisis within the framework of the South Asian region. With the ongoing foreign exchange crisis, certain factors in the agricultural sector have been severely impacted. In early 2021, the importation of agrochemicals including inorganic fertilizers, weedicides and pesticides were abruptly banned due to the developing foreign exchange crisis. This research will focus on the fertilizer crisis and its impact on rice production and consumption among small-scale farmers and consumers. The research will utilize newspaper and scholarly articles as secondary data sources, using interviews as primary data sources in order to explore the research questions. Finally, this research will also take a look at potential measures which could reduce the negative effects of the crisis on small-scale farmers and consumers. Drawing from the researchers' various fields, this research will explore the ways in which the region has historically been linked in terms of rice production and distribution. Further, the human security approach of food security will be used to analyse the effects of the fertilizer crisis on small-scale producers and consumers. The research will also approach the specific agricultural problems faced by the producers in order to identify feasible solutions to the crisis.

***Keywords: Agriculture, food security, rice production, South Asia***

*Session III [B] 3.00pm to 4.30pm*

*Chaired by Mr. Krishan Siriwardhana*

***අවිනිශ්චිතභාවය පිළිබඳ විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම***

**ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය සහ එහි සමාජ - ආර්ථික බලපෑම පිළිබඳ විමසුමක්**

ඩබ්ලිව්.ඩී.එල්.එච්. විතානගේ
තාවකාලික කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**සාරසංක්ෂේපය**

'ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය සහ එහි සමාජ-ආර්ථික බලපෑම' පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණය මගින් සිදු කෙරිණි. සමාජයේ සිදුවන නීතිවිරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධව ගැඹුරින් පරීක්ෂා කොට මතු කරගත් තොරතුරු ඔස්සේ සිදු කරන වාර්තාකරණය 'ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණයයි. වඩාත් සාධාරණ හා නීතිගරුක සමාජ-ආර්ථික පසුබිමක් නිර්මාණයෙහි ලා ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය මගින් සිදු කරන බලපෑම කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි. විනයවත් හා නීතිගරුක සමාජ පද්ධතියක් ඇති කිරීමෙහි ලා රූපවාහිනී ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණයේ කාර්යභාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. එම අරමුණට ළඟා වීම සඳහා පර්යේෂණ සීමාව ලෙස 2019 ජූලි මස 01 දින සිට 2020 ජූනි මස 01 දින දක්වා 'හිරු' නාලිකාව ඔස්සේ විකාශනය වූ හිරු ´CIA` වැඩසටහන් මාලාව සහ 'දෙරණ' නාලිකාවෙහි "උකුස්සා" වැඩසටහන් මාලාව අධ්‍යයනයට පාත්‍ර කරන ලදී. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේද භාවිතයට ගත් අතර ප්‍රමාණාත්මක දත්ත ලබාගැනීමේ දී සමීක්ෂණ සහ සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රම යොදා ගන්නා ලදී. විශේෂයෙන් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් ක්‍රියාත්මක 'මාධ්‍ය අධ්‍යයනය හා පුවත්පත් කලාව' පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අට වන කණ්ඩායමේ සිසුන් 40 දෙනෙකු අතර ප්‍රශ්නාවලි ලබා දීමෙන් ප්‍රමාණාත්මක දත්ත එක් රැස් කර ගත් අතර සමකාලීන සමාජ පැතිකඩ අධ්‍යයනය සඳහා පුස්තකාල අධ්‍යයනය මගින් දත්ත සපයා ගැනුණි. මෙලෙස සපයා ගත් දත්ත සන්සන්දනාත්මකව හා විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම සිදු කර ඇත. මෙම පර්යේෂණය මගින් එළඹි අවසන් නිගමනය වූයේ මෙරට ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය මගින් යහපත් සමාජ ආර්ථික පසුබිමක් නිර්මාණයෙහි ලා සෘජු බලපෑමක් සිදු කරන බව හා ඒ අතරිනුත් රූපවාහිනී මාධ්‍ය මගින් සිදුවන ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය වැඩි සමාජ-ආර්ථික බලපෑමක් සිදු කිරීමට සමත් වන බව ය. ජනමාධ්‍යවේදීන් වෙත ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳ විශේෂඥ පුහුණුවක් ලබා දීමෙන් මෙහි ඵලදායීත්වය ඉහළ නංවා ගත හැකි බව ද සඳහන් කළ යුතු ය.

***මුඛ්‍ය පද : ගවේෂණාත්මක, ප්‍රවෘත්ති, වාර්තාකරණය, සන්නිවේදනය, අනාවරණය***

## ලීෂ්මනයිසිස් රෝගය පිළිබඳ තොරතුරු මූලාශ්‍රයක් ලෙස YouTube: අන්තර්ගතයේ ගුණාත්මකබව, විශ්වාසනීයත්ව සහ ග්‍රාහක අදහස් විශ්ලේෂණය

ඒ.පි.මල්ලවආරච්චි[1], එස්.අගංපොඩි[2], එම්.වීරසිංහ[3]

[1]ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

[2]ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

[3]ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**සාරසංක්ෂේපය**

වර්තමානයේ ලීෂ්මනයිසිස් රෝගය රටවල් 98 ක ව්‍යාප්තව පවතින අතර එය බෝවන රෝග අතරින් 09 වන ස්ථානයේ පවතී. මෙම රෝගය කළමනාකරණය කිරීම සඳහා WHO විසින් හඳුන්වා දී ඇති ප්‍රධාන උපායමාර්ගික අරමුණුවලින් එකක් වන්නේ, සියලු ප්‍රජාවන්ට තීරණාත්මක තොරතුරු සන්නිවේදනය කිරීම සහ වැරදි තොරතුරු පැතිරීම වැළක්වීමයි. මෙම අධ්‍යයනයේදී, වෛද්‍ය හා වසංගත රෝග තොරතුරු සඳහා බහුලව භාවිතවන වෙබ් පාදක වේදිකාවක් වන YouTube.com හී අන්තර්ගත විශ්ලේෂණයක් සිදුකොට ඇත. ලීෂ්මනයිසිස් රෝගය පිළිබඳව තොරතුරු මූලාශ්‍රයක් ලෙස YouTube වීඩියෝවල අන්තර්ගතයේ ගුණාත්මකබව, විශ්වසනීයත්වය සහ ග්‍රාහක අදහස් විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන අතර මහජන සෞඛ්‍ය තොරතුරු මූලාශ්‍රයක් ලෙස YouTube භාවිතකළ හැකිද? යන්න විමර්ශනය කිරීම විස්තරාත්මක සැලසුමකින් සිදුකොට ඇත. මූල පද ලෙස “ලීෂ්මනයිසිස්” සහ “වැලිමැස්සා” යන්න 2020 අප්‍රේල් 04 වනදින YouTube වේදිකාවේ, පෙරනය තුළ Relevance යන්න භාවිතකොට සෙවීම සිදුකර තෝරාගත් වීඩියෝ 21 ක් සමාලෝචනය කරන ලදී. තෝරාගත් නිර්ණායක සපුරනලද, ඉදිරිපත් කරන්නාගේ මූලාශ්‍රය මත පස්ලක්ෂ්‍ය මෙවළමක් අනුව (DISCERN) ලකුණු සහ ගෝලීය තත්ත්ව ලකුණු (GQS) අනුව වීඩියෝ 17ක් (N=17) ඇගයීමට ලක්කරන ලදී. සිංහල භාෂාවෙන් පමණක් ඇති වීඩියෝ කෙරෙහි අවධානය යොමුකර ඇති අතර තෝරාගත් වීඩියෝවල අන්තර්ගතය පර්යේෂකයා විසින් විශ්ලේෂණය කර ඇත. එහිදී අදාළ වීඩියෝවන්හී ශ්‍රව්‍ය ආඛ්‍යානය හා උපසිරස යොදා ගන්නා අවස්ථාවන් තේමාත්මක විශ්ලේෂණයට ද, දෘශ්‍ය ආඛ්‍යානය, සංඥාර්ථවේදී විශ්ලේෂණයට ද ලක්කරන ලදී. අධ්‍යයනයට හසුකරගන්න ලද සමස්ත වීඩියෝවන්හී, ප්‍රධාන තේමාවන් 03 ක් හා උපතේමාවන් 12 ක් හඳුනාගතහැකි වූ අතර කාණ්ඩගත කරනලද වීඩියෝවල GQS හා DISCERN ලකුණු සංඛ්‍යානමය වශයෙන් ඉහළබව සොයාගන්නා ලදී. මහජන සෞඛ්‍ය ගැටලු පිළිබඳ තොරතුරු බෙදාහැරීම සහ විමර්ශනය, රෝග විනිශ්චය හා ප්‍රතිකර්මය සඳහා සෞඛ්‍ය සේවා සන්නිවේදනය සඳහා YouTube සැලකියයුතු ප්‍රමාණයකින් භාවිත කළහැකි නමුත් ඒ සඳහා YouTube තවමත් පවතින්නේ ආරම්භක අවධියේය. මහජන අවබෝධය වැඩිකිරීම සඳහා සෞඛ්‍ය වෘත්තිකයින් වෙත මූලාශ්‍ර ලෙස ප්‍රවේශය ලබාදීමෙන් මෙහි ගුණාත්මකබව හා විශ්වාසනීයත්වය වැඩිකරගත හැකිය.

*මුඛ්‍ය පද : **YouTube**, ලීෂ්මනයිසිස්, වැලිමැස්සා, තොරතුරු මූලාශ්‍රය, විශ්වාසනීයත්වය*

**ස්තුතිය : වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ECLIPSE ව්‍යාපෘතිය, සෞඛ්‍ය පර්යේෂණ සඳහා ජාතික ආයතනය (NIHR), එක්සත් රාජධානිය**

# ලාංකේය දේශපාලන අස්ථාවරත්වයේ හෙළිදරව්ව සඳහා පුරවැසි මාධ්‍යකරණයේ මැදිහත්වීම

ජී.ඩබ්.එස්.කේ. ගුණරත්න
සමාජීවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන අස්ථාවරත්වය අද වන විට මුළු ලෝකයම කතාබහට ලක්වන කාරණාවක් වී ඇත. එම දේශපාලන අර්බුදය ආර්ථිකයට එල්ල වූ දරුණු ප්‍රහාරයකි. රටේ ආර්ථිකය සහ පරිපාලනය ඉතාමත් තීරණාත්මක ලෙස අකර්මණ්‍ය වීම වත්මන් දේශපාලනයේ අස්ථාවරත්වය තුළ සිදුවී තිබේ. අද වන විට ලංකාවේ දේශපාලන අස්ථාවරත්වය පිළිබඳ සාකච්ඡාව ජනගත කරලීම සඳහා පුරවැසි මාධ්‍යයකරණයේ මැදිහත්වීම අති විශාලය. එහිදී වත්මන් දේශපාලන අස්ථාවරත්වය පිළිබඳ ජනමාධ්‍ය අභිබවා පුරවැසි මාධ්‍යකරණය, සමාජ මාධ්‍ය උපයෝගී කරගෙන සිදුකරන බලපෑම කවරාකාරද? යන මුඛ්‍ය ගැටලුව අධ්‍යනය කිරීම මෙහිදී සිදු කරනු ලැබීය. එම මුඛ්‍ය ගැටලුව ඔස්සේ ලාංකේය දේශපාලන අස්ථාවරත්වයේ හෙළිදරව්ව සඳහා පුරවැසි මාධ්‍යකරණයේ මැදිහත්වීම කෙබඳුද? යන ගැටලුව අධ්‍යයනය කරනු ලැබීය. ඒ අනුව සමාජ මාධ්‍ය සමකාලීන සමාජ සංදර්භයේ ජීවත් වන පුද්ගල ජීවිත වලට අත්‍යවශ්‍ය උපාංගයක් වී ඇත. ඒ සඳහා විනිශ්චයගත නියැදියට අනුව පර්යේෂණයට සුදුසු පරිදි සමාජ මාධ්‍ය පිටු හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් යොදාගනු ලැබීය. ලාංකේය දේශපාලනයේ අස්ථාවරත්වය පිළිබඳ පුරවැසි මාධ්‍යකරණය තුළින් කතිකාවන් නිර්මාණය කිරීම සඳහා සමාජ මාධ්‍ය සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. ඒ සඳහා අන්තර්ගත විශ්ලේෂණය හා ප්‍රශ්නාවලි ක්‍රමය පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගනු ලැබීය. එම ක්‍රමවේදයන්ට අනුව කරුණු විශ්ලේෂණය කිරීමේ දී වත්මන් දේශපාලන අස්ථාවරත්වය පිළිබඳ හඬ නැංවීම සඳහා පුරවැසි මාධ්‍යයකරණය, සමාජ මාධ්‍ය උපයෝගී කරගෙන ප්‍රබල බලපෑමක් සිදුකර ඇති බව නිගමනය විය. ඒ අනුව සමකාලීන ගෝලීය සන්දර්භය පුරා අධිවර්ධිත ක්ෂේත්‍රයක් ලෙස පුරවැසි මාධ්‍යකරණය සඳහා සමාජ මාධ්‍ය යොදාගැනීම ප්‍රබල වී ඇති බව ප්‍රතිඵල වශයෙන් හඳුනාගැනීමට හැකි විය. ලාංකේය සමාජයේ දේශපාලනය, ආර්ථිකය අස්ථාවරත්වය පිළිබඳ විදේශීය රටවල් වලට බලපෑම් කිරීමට නොහැකි වන තරමට පුරවැසි මාධ්‍යකරණය සමාජ මාධ්‍ය මගින් හිස ඔසවා ඇත. ඒ සඳහා අතත්‍ය බලයක් (Virtual Power) නිර්මාණය වී ඇති බව හඳුනා ගැනීම සුවිශේෂීත්වයකි. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නීති විරෝධී ලෙස පද්ධති ජාල සඳහා ඇතුළු වන්නන්ගෙන් (Hackers) උදව් ලබා ගැනීමට පවා සමාජ මාධ්‍යයෙහි ක්‍රියාකරුවන්වන වත්මනේ පුරවැසි මාධ්‍යකරණයට හැකියාව ලැබී ඇත. පුරවැසි මාධ්‍යකරණය අද වන විට මාර්ගගත ජනමාධ්‍යවේදය (Online Journalism) ලෙසද පරිවර්තනය වීම මෙම තත්වය හමුවේ දැකගත හැකි අවස්ථාවක් වේ. ඒ අනුව මෙම අර්බුදය හමුවේ දේශපාලනයේ ස්ථායිභාවය සාකච්ඡාවට පුරවැසි මාධ්‍යකරණය උපයෝගී කරගෙන විචාරශීලී මහජන කතිකාවක් සමාජ මාධ්‍ය තුළින් ගොඩ නැංවීම යෝග්‍ය බව ගම්‍යමාන වේ.

***මුඛ්‍ය පද : ලාංකේය දේශපාලනය, අස්ථාවරත්වය, පුරවැසි මාධ්‍යකරණය***

*Session III [C] 3.00pm to 4.30pm*

*Chaired by Dr. Darshi Thoradeniya*

***Women's Agency in Uncertain Times/*** *අවිනිශ්චිත කාලවලදී කාන්තා නියෝජිතායතනය*

**ආසියානු කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම වෙත යොමුවීම වළක්වාලන සාධක**

අයි.එම්. දිසානායක
ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

ලෝකය තුළ සහස්‍ර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පවුල් සැලසුම්කරණය අත්‍යවශ්‍ය බව සාහිත්‍යය තුළ දක්වා ඇත. පවුල් සැලසුම් හෝ විසංග්‍රාහක ක්‍රම අනුගමනය කිරීම කාන්තාවන්ගේ සෞඛ්‍යයට සහ එක් එක් ගර්භනීභාවයේ ප්‍රතිවිපාක කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරනු ලබයි. ආසියානු කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම භාවිතය ගෝලීය සාමාන්‍යයට වඩා අඩු ප්‍රතිශතයක පවතී. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වූයේ ආසියානු කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම වෙත යොමුවීම වළක්වාලන සාධක මොනවාද යන්නයි. අධ්‍යතන වර්ෂ 2002 සිට 2022 දක්වා මෙම අධ්‍යයන ක්ෂේත්‍රය ආශ්‍රය කරගත් පර්යේෂණ පත්‍රිකා, සාහිත්‍යය සහ සමීක්ෂණ වාර්තා කේන්ද්‍ර කරගත් පර්යේෂණ සාහිත්‍යය ඇසුරින් කරගනිමින් කලාපීය කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම වෙත යොමුවීම වළක්වාලන සාධක තේමාත්මකව අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ සාහිත්‍යය තුළ පැහැදිලිව හඳුනාගෙන තිබූ කරුණක් වන්නේ ආසියානු කලාපයේ කාන්තාවන් අතර බොහෝ අනපේක්ෂිත ගැබ් ගැනීම් සිදු වන්නේ සාම්ප්‍රදායික විසංග්‍රාහක ක්‍රම භාවිතා කිරීම හේතුකොටගෙනය යන්නයි. සංස්කෘතික ආකල්ප, විසංග්‍රාහක ක්‍රම සහ ප්‍රජනනය පිළිබඳ දැනුම නොමැතිකම, සමාජ - ප්‍රජාවිද්‍යාත්මක සාධක සහ සෞඛ්‍ය සේවා බාධක, සීමිත දැනුම, කාන්තා ස්වාධිපත්‍යය, වැරදි වැටහීම, සංස්කෘතික හා සෞඛ්‍ය පද්ධති දුර්වලතාවයන් ආසියානු කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම වෙත ප්‍රවේශවීම සඳහා ඇති තවත් ප්‍රධාන බාධාවන් බවට සාහිත්‍ය සමාලෝචනය ඔස්සේ සාක්ෂි සපයයි. බහුතරයක් කලාපීය කාන්තාවන්ට සහ නව යොවුන් වියේ පසුවන අයට ප්‍රජනක ඉන්ද්‍රිය කායික විද්‍යාව සහ විසංග්‍රාහක ක්‍රම පිළිබඳ අවබෝධයක් හෝ ප්‍රමාණාත්මක දැනුමක් නොමැති බවද සාහිත්‍යය ඔස්සේ අවධාරණය විය. සංස්කෘතික වශයෙන් සංවේදී පවුල් සැලසුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පවතින සෞඛ්‍ය පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සහ සැලසුම්ගත මාපියත්වයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම සඳහා ජන මාධ්‍ය කේන්ද්‍රකරගත් ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය සහ පුහුණු හා ආසන්න වයස් පරාසයන්ට අයත් වෘත්තීය ප්‍රජාවක් විසින් ලිංගික සෞඛ්‍ය අධ්‍යාපනය ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ගැටළු සාකච්ජාවට ලක්කිරීම, ආසියානු කාන්තාවන් අතර නවීන විසංග්‍රාහක ක්‍රම වෙත යොමුවීම වර්ධනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රමෝපායන් වශයෙන් සාහිත්‍යය ඔස්සේ යෝජනා කරනු ලබයි.

***මුඛ්‍ය පද: ආසියානු කාන්තාවන්, නවීන විසංග්‍රාහක ක්‍රම, සමාජ - ප්‍රජාවිද්‍යාත්මක සාධක***

**දරිද්‍රතාවය පිටුදැකීම සඳහා කාන්තා සවිබල ගැන්වීම් දී ක්ෂුද්‍ර මූල්‍යකරණය තුළින් ඔවුන්ගේ සමාජ - ආර්ථික යහපැවැත්ම කෙරෙහි සිදුව ඇති බලපෑම**

කේ.කේ.කේ.සී. රංගන[1], එච්.කේ. ගොරකපිටිය[2]
[1]දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-කොළඹ
[2]අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය- ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන දුප්පත් හා අඩු ආදායම්ලාභී ඔවුන්ගේ ව්‍යවසාය සංවර්ධනය, මුදල් තැන්පතු, බැර, ගෙවීම් හා සේවා ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය සේවා සැපයීම ලෙස අර්ථ දැක්විය හැකිය. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වලින් ණය ලබාගැනීම සඳහා බොහෝ පුද්ගලයන් යොමු වී සිටී. කාන්තාවන් සවිබල ගැන්වීම ලොව පුරා රට වල සංවර්ධන ක්‍රියාවලියේ කේන්ද්‍රීය ප්‍රශ්න වලින් එකකි. දරිද්‍රතාවය කාන්තා බලගැන්වීමේ ප්‍රධානතම හේතුවකි. විවිධ ක්ෂුද්‍ර සහ සාර්ව මට්ටමේ උපාය මාර්ග භාවිතා වේ. මේ අනුව ක්ෂුද්‍ර මූල්‍යකරණය තුළින් කාන්තාවන්ගේ සමාජ- ආර්ථික යහපැවැත්ම කෙරෙහි ඇතිවන බලපෑම කෙසේද? යන ගැටලුව කේන්ද්‍රකර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබුණි. මෙහි මූලික අරමුණ වනුයේ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා කාන්තා සවි බලගැන්වීම්දී ක්ෂුද්‍ර මූල්‍යකරණය තුළින් ඔවුන්ගේ පවුල් කෙරෙහි ඇති කරනු ලබන සමාජ- ආර්ථික බලපෑම අධ්‍යයනය කිරීමයි. මේ සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයමත අසම්භාවිතාමය නියැදි ක්‍රමය යොදාගනු ලැබුණි. මෙම අධ්‍යයනය ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිදිවිතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය මුල් කර ගනිමින් සිදුකරනු ලැබුණි. එහි හිම බෝල නියැදිය උපයෝගීකර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගැනීමට යොමුවී සිටින කාන්තාවන් 50 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. ආකෘතිමය සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය යටතේ දත්ත රැස්කිරීම සිදුකරන ලදී. ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය මඟින් ද ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය මඟින් ද විශ්ලේෂණය සිදු කරන ලදී. ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීම සඳහා යොමු වී සිටින කාන්තාවන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 30 - 40 ත් වන බව අනාවරණය විය. අධ්‍යයනය කරන ලද නියැදියේ දී ණය ලබා ගැනීම සඳහා යොමු වී සිටින කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම අධ්‍යයනය කිරීමේ දී ඉන් වැඩි දෙනෙක් එනම් 23 දෙනෙකුගේ අධ්‍යාපන මට්ටම 6 - 10 වසර දක්වා බව අනාවරණය විය. තවද කාන්තාවන් ලබාගන්නා ලද ණය මුදල්, මුදල් උත්පාදන ක්‍රමවේදයන් සඳහා භාවිතා කිරීමකින් තොරව එදිනෙදා කටයුතු සඳහා වියදම්කර ඇති බව අනාවරණය විය. එමෙන්ම ණය මුදල් ගෙවීමේ දී පවතින ඉහළ පොලී අනුපාතය නිසාවෙන් කාන්තාවන්ගේ පවුල් තුළ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වී ඇත. මූල්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් විවිධ තර්ජන පැවතීම, ස්වාමිපුරුෂා සමඟ ගැටුම් ඇතිවීම, සිය දිවිනසා ගැනීම් සිදුවීම වැනි සෘණාත්මකතත්ත්වයන් පවතින බව අනාවරණය විය. මේ අධ්‍යයනය අනාවරණයන් මඟින් අවසාන වශයෙන් නිගමනය කළ හැකි වනුයේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල පොලී අනුපාතය නියාමනය හෝ අධීක්ෂණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු අතරම කාන්තාවන් තුළ දැනුවත්භාවයක් ඇති කිරීම කාලෝචිත අවශ්‍යතාවයක් බවයි.

***මුඛ්‍ය පද : ක්ෂුද්‍ර මූල්‍ය ණය, කාන්තාව, පවුල, දරිද්‍රතාවය, යහපැවැත්ම***

**Contribution of Demographic, Social and Economic Factors to Permanent Celibacy among Women in Sri Lanka**

M.G.D.I.D Wijerathne

Department of Demography, University of Colombo, Sri Lanka

**Abstract**

This abstract is about permanent celibacy among women in Sri Lanka. Permanent celibacy is defined as being single at the time of death and having survived at least till the age 50. This topic has been discussed more in relation to females than males. Marital status and age at marriage of women influence the determination of fertility in a country. Accordingly, it is important to study permanent celibacy because celibate women directly influence the population growth of a country. The main objective of this study is to examine the demographic and social status of permanently celibate women mainly basing on the secondary data obtained from the Household Income and Expenditure Survey 2016. Accordingly, it is possible to identify the reasons and factors of females remaining unmarried until the end of the reproductive age group in Sri Lanka. Ethnicity, religion, level of education, and occupation play a major role in this research. When it comes to permanent celibacy among women by ethnicity, 4.4% of women among the Sinhalese aged 50-54 are celibate. Among the never married women, the highest proportion is observed among the Christian/Roman Catholics followed by Hindus. Depending on the level of education, among the women aged 50-54 who have never received school education, no one could be identified as permanently celibate. A relatively large proportion (8.5%) of women with a degree or higher education, remain unmarried until the age group of 50-54. Thus, permanent celibacy is identified among women who have received a higher education. When focusing on the economic status of the respondents 44.7% of respondents are engaged in economic activity. There are 23.6% of respondents who are government employees, and the majority are private sector employees (36.4%). Thus, it is possible to identify unique characteristics of celibate women in Sri Lanka.

***Keywords: Permanent Celibacy, Never Married Women, Life Expectancy***